දුරකථන
தொலைபேசி
Telephones
011-2136600
011-2136650

ලේකම්
செயலாளர்
Secretary
011-2136602

ෆැක්ස්
தொலைநகல்
Fax
011-2876169
011-2876181

විද්‍යුත් තැපැල
மின் - அஞ்சல்
E - mail
info@psc.gov.lk

වෙබ් අඩවිය
இணையத்தளம்
Website
www.psc.gov.lk

# රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
## அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
## OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை
**No. 1200/9, Rajamalwatta Road, Battaramulla**

මගේ අංකය
எனது இல.
My No. PSC/OPR/ICV/01/2023

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2023.10.5

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් හා දෙපාර්තමේන්තු ප්‍රධානීන්,

<u>රාජ්‍ය සේවයේ පුරප්පාඩු තනතුරු සඳහා නිලධාරීන් බඳවා ගැනීම</u>

රාජ්‍ය මූල්‍ය කළමනාකරණය සම්බන්ධ නව ප්‍රතිපත්ති අනුව රාජ්‍ය සේවයේ ප්‍රශස්ථ කාර්ය මණ්ඩලයක් පවත්වාගෙන යාමට සිදුව ඇත. එහිදී ජාතික අයවැය චක්‍රලේඛ 04/2023 අනුව අත්‍යවශ්‍ය පුරප්පාඩු පිරවීම සඳහා ප්‍රතිපාදන, බඳවා ගැනීමේ ප්‍රගතිය අනුව ජාතික අයවැය දෙපාර්තමේන්තුව විමසා සලසා ගත යුතු වේ.

02. ඒ අනුව නව බඳවා ගැනීම්වලදී රාජ්‍ය සේවයේ බඳවා ගැනීමේ ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සම්බන්ධ අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද කමිටුව/ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් බඳවා ගැනීම් සඳහා අනුමත කරනු ලබන පුරප්පාඩු පමණක් සලකා බැලිය යුතුවේ. ඒ අනුව අයදුම්පත් කැඳවීමේ නිවේදන ප්‍රසිද්ධියට පත් කිරීමට පුරප්පාඩු සංඛ්‍යාව සඳහා අදාල අනුමැතියන් ලබා තිබීම අත්‍යවශ්‍ය වේ. එබැවින් බඳවා ගැනීමේ කටයුතු කඩිනම් කර ගැනීම සඳහා අයදුම්පත් කැඳවීමේ නිවේදන ප්‍රසිද්ධියට පත් කිරීමට පූර්වයෙන් ලබා ගතයුතු අනුමැතීන් ලබා ගැනීමට කටයුතු කළ යුතු බවට නිරීක්ෂණය කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාව ඉදිරියේදී ඒ අනුව කටයුතු කරන ලෙස ඔබ වෙත දැන්වීමට තීරණය කර ඇත.

03.ඒ අනුව මේ සම්බන්ධයෙන් ඔබගේ විෂයපථයට අයත් වන සියලු ආයතනවල අදාල නිලධාරීන් දැනුවත් කර ඉහත විධිවිධානයන්ට අනුව කටයුතු කරන ලෙස කාරුණිකව දැනුම් දෙමි.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අණපරිදි,

ඩබ්ලිව්. එච්.එම්.එම්.සී.කේ දයාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව